# සාමාන්‍ය සමයේ පසළොස්වන සතිය
# බදාදා

## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.

නික්මයාම 3 : 1-6, 9-12

"දැවෙන පඳුරේ ගින්න අතරින් ස්වාමීන් වහන්සේ මෝසෙස්ට දර්ශනය වූ සේක."

මෝසෙස් තම මාමණ්ඩිය වූ මිදියන්හි පූජක තැන වන ජෙත්රෝගේ එළු පට්ටි රැකබලා ගනිමින් සිටියේය. ඔහු ඒ පට්ටි පාළුකරය හරහා දක්කාගෙන ගොස්, හෝරෙබ් නම් දෙවියන් වහන්සේගේ කන්දට පැමිණි කල සමිඳාණන් වහන්සේගේ දූතයා පඳුරක් මැදින් නැගුණු ගිනි ජාලාවක ආකාරයෙන් ඔහුට දෘෂ්‍යමාන විය. ඔහු බැලූ විට පඳුර ගින්නෙන් ඇවිළී ගිය නමුත් එය නොදැවෙන බව දිටීය. මෝසෙස්, "මෙය පුදුමයකි. මම දැන් ඊට ළංවී, පඳුර නොදැවෙන්නේ මන්ද කියා බලමි"යි තමාට ම කියා ගත්තේය. ඔහු එය බලන පිණිස ඊට ළංවන බව සමිඳාණන් වහන්සේ දුටු විට, දෙවියන් වහන්සේ පඳුර මැදින්, "මෝසෙස්, මෝසෙස්" කියා ඔහුට හඬ ගැසූ සේක. ඔහු ද "මම මෙහි ය"යි කීවේය. එවිට දෙවියන් වහන්සේ කතා කොට, "මෙතැනට ළං නොවන්න. නුඹේ පාදවලින් වහන් ගලවා දමන්න. නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකැ"යි වදාළ සේක. තවදුරටත් උන්වහන්සේ කතා කරමින්, "නුඹේ පියාගේ දෙවියන් වහන්සේ මම ය. ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද, ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද, ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද මම ය"යි වදාළ

සේක.  මෝසෙස් ද දෙවියන් වහන්සේගේ මුහුණ දෙස බැලීමට බිය වූ බැවින් තම මුහුණ වසා ගත්තේ ය.

දැන් ඉතින්, මෙන්න ඉශ්රායෙල් ජනතාවගේ මොර ගැසීම මා වෙත නැඟී ඇත.  තවද, මිසරවාසීන් දෙන දරුණු පීඩාවන් ද මා දැක ඇත.  එබැවින් දැන් ඉතින් එන්න.  මාගේ සෙනඟ වන ඉශ්රායෙල් ජනතාව මිසරයෙන් පිටතට ගෙන යන පිණිස මම නුඹ පාරාවෝ වෙත යවමි.”

එවිට මෝසෙස් දෙවියන් වහන්සේට කතා කොට, “පාරාවෝ වෙත ගොස් ඉශ්රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙන යනු පිණිස මම කවරෙක් දැ”යි ඇසීය.  දෙවියන් වහන්සේ උත්තර දෙමින්, “මම නුඹ සමඟ සිටිමි. මා නුඹ එවූ බව දැන ගැනීමට නුඹට දෙන ලකුණ මෙය වේ.  එනම් නුඹ සෙනඟ මිසරයෙන් පිටතට ගෙනා විට, මේ කන්ද මත නුඹලා දෙවියන් වහන්සේ වන මා හට වැඳුම් පිඳුම් කරන්නහු ය”යි වදාළ සේක.

දේව වචනය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 103 : 1-4, 6-7

පිළිතුර: සමිඳාණෝ දයානුකම්පාවෙන් පරිපූර්ණ ය.

ගීය:

මාගේ සිත සමිඳුන් පසසන්න. හද පත්ලෙන්ම එතුමන්ගේ ශුද්ධ නම පසසන්න. මාගේ සිත, සමිඳුන් පසසන්න. එතුමන්ගේ සියලු උපකාර අමතක නොකරන්න.

එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක. මාගේ සියලු රෝග සුව කරන සේක. මාගේ ජීවිතය පාතාල ලෝකයෙන් මුදාලන සේක. ප්‍රේමය හා දයාව නමැති කිරුළෙන් මා සරසන සේක.

සමිඳාණෝ සාධාරණ ලෙස ක්‍රියා කරන සේක. පීඩිතයන්ට එතුමාණෝ යුක්තිය ඉටු කරන සේක.
සමිඳාණෝ ස්වකීය මාර්ග මෝසෙස්ටත්, තම බලවත් ක්‍රියා ඉශ්රායෙල් සෙනඟටත් දැන්වූ සේක.

## සුබ පුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස,
දේව රාජ්‍යය පිළිබඳ අභිරහස ඔබ වහන්සේ බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබ වහන්සේට ප්‍රශංසා වේවා!
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව්තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

මතෙව් 11 : 25 – 27

"පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ සේක."

ඒ අවස්ථාවේදී ජේසුස් වහන්සේ උත්තර දෙමින් මෙසේ වදාළ සේක. "ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට, බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි. එසේය, පියාණෙනි, ඔබට ප්‍රියමනාප එයම ය. මාගේ පියාණන් වහන්සේ සියල්ල මට පවරා දී ඇත. පියාණන් වහන්සේ හැර, අන් කිසිවෙක් පුත්‍රයාණන් නොහඳුනති. පුත්‍රයාණන් සහ පියාණන් වහන්සේ එළිදරව් කිරීමට පුත්‍රයාණන් විසින් තෝරාගනු ලැබූ යමෙක් වේ ද ඔහු හැර අන් කිසිවෙක් පියාණන් වහන්සේ නොහඳුනති.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.